
# ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රා



**නිපුනතාවය** - දේශීය, විදේශීය චිත්‍ර මූර්ති කැටයම් ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හදුනාගෙන ඒවායේ කලා ලක්ෂණ නිර්මාණ වලදී භාවිතයට ගනී.

**නිපුනතා මට්ටම** - ඉන්දීය ඓතිහාසක කලා නිර්මාණ අධ්‍යයනය

**ඉගෙනුම් ඵල** -

- ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් හමු වී ඇති සුවිශේෂී කලා කෘති සොයා බලයි.
- ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල චෛතිහාසික පසුබිම විස්තර කරයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.


**සැකසුම - කේ. එම්. ටී. එම්. පියතිලක (කෑ/දෙහි/ දොඹේපොල කනිෂ්ඨ විද්‍යාලය.**









# ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රා

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ආශ්‍රිතව මුද්‍රා 2000 කට අධික සංඛ්‍යාවක් හමු වී ඇත.
- වෙළෙඳ භාණ්ඩවල ඇසුරුම් සලකුණු වශයෙන් යෙදීමට මෙම මුද්‍රා භාවිත කළ බව අනුමාන කරයි.
- මෙම මුද්‍රා දිගටි, අටපට්ටම් හා සතරැස් ආදී හැඩවලින් යුක්ත වේ.
- මෙම මුද්‍රා මත රූපවලට අමතරව අක්ෂර දක්නට ඇති අතර මේ අක්ෂර මේ වන තෙක් කියවීමට හඳුනාගෙන ඇත.
- මුද්‍රා මගින් ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික ඇදහිලි, විශ්වාස පිලිබිඹු කරන අතර ඔවුන්ගේ ජීවන විලාසය, සංස්කෘතික ලක්ෂණ කලා කෞශල්‍යය හා තාක්ෂණික හැකියාව පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

1



# මොල්ලිය සහිත ගව රූපය

# ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ ගව රූප සහිත මුද්‍රා විසි පහකටත් වැඩි ප්‍රමාණය අතරින් කලාත්මක ප්‍රකාශනයක් සහිත මුද්‍රාවකි.

# මෙහි ගවයාගේ ගති ස්වභාවය ඉතාමත් **තාත්වික** ලෙස නිරූපණය කර තිබේ.

# පාර්ශවදර්ශී ස්වරූපයෙන් යුතු ගව රූපයේ ශරීරාංග තුළින් **ශක්තිය, තේජස හා ජව සම්පන්න බව** හොඳින් ඉස්මතු වී පෙනේ.

# **ශිව දෙවියන්ගේ වාහනය වූ නන්දි ගවයා** මින් සංකේතවත් කරන බව අදහස් කෙරේ.

# බෙල්ලේ රැළි ශෛලීගත රටාවෙන් නිරූපණය කර ඇත. ගෙල වටා දමා ඇති තැල්ල මගින් මෙම මුද්‍රාව විසිතුරු වී ඇත.

# ඇතැම් මුද්‍රාවල ගව රූප අභියස සුවඳ දුම්, වැනි වස්තු දක්නට තිබූ නිසා මෙම ගව රූප අති පූජනීය වස්තු ලෙස සලකා පුද පූජා තබන්නට ඇතැයි සිතිය හැකි ය.

# මෙම මුද්‍රාවට අමතරව එක් අඟක් සහිත ගවයා, කොට අං සහිත ගව රූප ආදී ගව සංකේත සහිත මුද්‍රා විශාල සංඛ්‍යාවක් හමු වී ඇති බවට වාර්තා වේ.

# 2



# පශුපති (ශිව)

# මෙම මුද්‍රාව **අං සහිත දෙවියා** ලෙස හඳුන්වයි.

# ඔහුගේ හිස මත අං යුගලක් සහිත ශිර්ෂාභරණයකි. එමෙන් ම ගෙළ හා දෙඅත් වස්ත්‍රාභරණවලින් සරසා ඇත.

# ආසනයට පහළින් මුවෝ දෙදෙනෙකි. එසේම දේව රූපය වටා රයිනෝ, වෘෂභ, හස්ති සහ කොටි රූප දැකගත හැකි ය.

# **මෙම මුද්‍රාවෙන් නිරූපිත දෙවියන් ශිවගේ මූලාදර්ශයක්** බව සර් ජෝන් මාෂල් මහතා පවසා ඇත. එනම් ශිවගේ එක් වේශයක් වන පශුපති (කෘෂි කර්මාන්තයට අධිපති) මින් නිරූපිත බවයි.

# දේවරූපය ඉදිරි පෙනුමෙන් යුතු වන අතර සෙසු සියලු සත්ව රූප පාර්ශවදර්ශී ස්වරූපයෙන් දක්වා ඇත.

## වැඩිදුර තොරතුරු පහත සඳහන් වෙබ් අඩවි හරහා ලබා ගත හැක.

https://www.youtube.com/watch?v=LNgRfumBjPI

https://www.e-thaksalawa.moe.gov.lk/web/si/library-section/e-library-content/item/456-indunimna.html?catid=0

https://si.wikipedia.org/wiki/%E0%B6%89%E0%B6%B1%E0%B7%8A%E0%B6%AF%E0%B7%94_%E0%B6%B1%E0%B7%92%E0%B6%B8%E0%B7%8A%E0%B6%B1_%E0%B7%81%E0%B7%92%E0%B7%82%E0%B7%8A%E0%B6%A7%E0%B7%8F%E0%B6%A0%E0%B7%8F%E0%B6%BB%E0%B6%BA

https://divaina.com/daily/index.php/visheshanga3/48367-2020-09-29-11-38-59

## මෙම පාඩම ඇසුරින් සකසන ලද "**World wall**" ක්‍රියාකාරකමට යොමුවීම සඳහා පහත සඳහන් ලින්ක් එක භාවිත කරන්න.

https://wordwall.net/resource/19152979